**ශීර්ෂය 124 - සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 124 - සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 19 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂයපථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 29,135.24 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 28,429.81 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 705.43 ක් හෙවත් සියයට 2.42 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 10,853.81 | 10,620.86 | 232.95 | 2.15 |
| මූලධන | 18,281.43 | 17,808.95 | 472.48 | 2.58 |
| **එකතුව** | **29,135.24** | **28,429.81** | **705.43** | **2.42** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 9.11 | 9.06 | 5.91 | 11.16 | 45.00 | 32.13 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පතු ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 5.66 ක් විය.

| **ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0129/000 | 1.33 |
| 6000/0000/00/0013/0086/000 | 0.03 |
| 6000/0000/00/0015/0037/000 | 0.03 |
| 6000/0000/00/0016/0078/000 | 3.67 |
| 6000/0000/00/0019/0020/000 | 0.60 |
| **එකතුව** | **5.66** |

**2.4 විගණන නිරීක්ෂණය**

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

### 3.2 විගණන සාක්ෂි නොවීම

ලදුපත්, බිල්පත්, බෙදාහැරීම් ලේඛන, ප්‍රගති වාර්තා ආදී වූ අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.45,000 ක ට අදාල වූ ගනුදෙනු 02 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 12401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.45,306 ක් විය. එම ශේෂ වර්ෂ 2 සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිය පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) 2014 අගෝස්තු මාසයේ සිට සේවයෙන් විශ්‍රාම ගන්වන ලද තාක්ෂණ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.163,105 ක ණය ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ඇ) අත්තිකාරම් ගිණුමේ ගැලපීම් සටහන් ලෙස දක්වා තිබූ රු.58,859 ක ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 අනුකූල නොවීම්

-------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 752(2) | - | අමාත්‍යාංශයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද අතිරික්තතා 20 ක් සහ ඌනතා 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) **ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන චක්‍රලේඛයේ 06 ඡේදය | 99,560 | අත්‍යාවශ්‍ය නොවන ක්‍රියාකාරකම් සඳහා වියදම් සීමා කළ යුතු වුවත්, අමාත්‍යවරු දෙදෙනෙකුගේ වැඩ භාරගැනීමේ උත්සවය සම්බන්ධව රු.99,560 ක් වැය කර තිබුණි. |

## 3.5 විදේශාධාර ව්‍යාපෘති

------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුලාශ්‍රය යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.336,700,000 ක් වූ අතර, ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.321,059,760 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වාර්ෂික ඇස්තමේන්තුව යටතේ "දිවි සවිය" ව්‍යාපෘතිය සඳහා රු.101,000,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට, ඉන් රු.88,129,978 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.12,870,021ක් උපයෝජනයන් නොකිරීම නිසා ව්‍යාපෘතියෙන් ඉටු කර ගත යුතුව තිබුණු අරමුණු අපේක්ෂිත මට්ටමෙන් ඉටු කර නොතිබුණි.

(ආ) ආබාධිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා වූ ව්‍යාපෘති ගිවිසුම යටතේ රු.61,100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.45,446,760 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.6 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්වේච්ඡා කටයුතු පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා 2014 ඔක්තෝබර් 16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එම ලේකම් කාර්යාලය පිළිබඳව නීතිමය පිළිගැනීමක් ලබාගැනීම සඳහා අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 පෙබරවාරි 22 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රතිපත්තිය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර මාස 02 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව තිබුණි. 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා එකතුව රු.1,087,438 ක් එම ව්‍යාපෘතිය වෙනුවෙන් වියදමක් කර තිබුණි. 2016 අගෝස්තු 31 දින වන විට එම කාර්යය ඉටු කිරීමට වර්ෂ 03 මාස 08 ක කාලයක් ගතවී තිබුණත්, අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයේ කටයුතු නිමකර නොතිබුණි.

(ඇ) සමාජසේවා අමාත්‍යාංශය හා දකුණු පළාත් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2013 දෙසැම්බර් 13 දින රු.174,820,800 කට (එකතු කළ අගය මත බදු හැර) දින 365 කින් නිමකිරීමේ කොන්දේසිය මත ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂය අවසානය වන විටත් අදාළ ඉදිකිරීම් කටයුතුවල නිමකිරීම් ප්‍රතිශතය ගැහැණු නේවාසිකාගාරය සියයට 72 ක්ද, මුළුතැන්ගෙය හා කෑම ශාලාව සියයට 60 ක් ද හා පිරිමි නේවාසිකාගාරය සියයට 13 ක්ද වශයෙන් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.50,200,000 ක් වැය කර තිබුණි.

## 3.7 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) වයස අවුරුදු 70 ට වැඩි මුල්‍යාධාර ලබන වැඩිහිටියන් සම්බන්ධව දත්ත පද්ධතියක් පිළියෙල කර යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ii) තනිමාපිය පවුල් සංවර්ධන වැඩසටහන යටතේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සම්බන්ධව 2013 වර්ෂයේ සිට 2015 දක්වා කාලය තුළ භෞතික ප්‍රගතිය පරික්ෂාවේදීද වැඩසටහන් පැවැත්වීම දිස්ත්‍රික්ක කිහිපයකට පමණක් සීමා කර තිබුණි. එම සංඛ්‍යාව 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පිළිවෙලින් දිස්ත්‍රික්ක 6,4 සහ 2 ක් වශයෙන් ක්‍රමයෙන් අඩුවී තිබුණි.

(iii) දිස්ත්‍රික්ක 08 ක වකුගඩු රෝගයෙන් පෙලෙන රෝගීන්ට මසකට රු.3,000 බැගින් ජීවනාධාර ගෙවීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් රු.353,400,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.344,951,019 ක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.8,448,981 ක් උපයෝජනය කර නොතිබුණි.

(iv) වර්ෂය ආරම්භයේදී හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ වකුගඩු රෝගයෙන් පෙලෙන රෝගීන් හඳුනාගෙන නොතිබුණි. 2015 අගෝස්තු හා ඔක්තෝබර් මාසවලදී පිළිවෙලින් රෝගීන් 550 ක් සහ 59 ක් සිටින බව සංඛ්‍යා ලේඛනවලින් අනාවරණය විය. කෙසේ වුවද, වර්ෂය අවසානයේ දිස්ත්‍රික්වලට යැවූ ප්‍රතිපාදනවලින් රු.15,681,000 ක් ඉතිරිව පැවතියද, අළුතින් හඳුනාගත් රෝගීන් සඳහා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **සැලැසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු අවස්ථා පහත දැක්වේ.

(i) තනි මාපිය පවුල් සංවර්ධන වැඩ සටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් 20 ක් පැවැත්වීම සඳහා සැළසුම්කර තිබුණද, ඉන් වැඩසටහන් 13 ක් පමණක් පවත්වා නොතිබුණි.

(ii) වකුගඩු රෝගයෙන් පීඩාවිඳින රෝගීන්ට මාසික මූල්‍යාධාර ගෙවීම ජනවාරි මාසයේ සිටම ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කළ යුතු වුවත්, අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන් සඳහා ජනවාරි මාසය සඳහා මූල්‍ය ආධාර ගෙවීමට පෙබරවාරි 05 දින ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. අනිකුත් දිස්ත්‍රික්කයන් සඳහා ජනවාරි සිට ජුනි දක්වා වූ මූල්‍යාධාර ගෙවීමට ප්‍රතිපාදන නිදහස් කිරීම 2015 අප්‍රේල් මාසයේදී සිදු කර තිබුණි. මේ තත්ත්වය මත වකුගඩු රෝගීන්හට මූල්‍යාධාර ලබාදීමේදී මාතලේ, වවුනියාව, මුලතිව්, අම්පාර, ත්‍රිකුණාමලය හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක 06 හි මාස 04 ක සිට මාස 08 ක් දක්වා කාල ප්‍රමාදයන් සිදු කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 03 කදී දිස්ත්‍රික්ක 8 ක වකුගඩු රෝගීන් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද සංඛ්‍යා ලේඛන මත ගෙවීම් කටයුතු සිදුකර තිබුණි. කෙසේ වුවද, එම රෝගීන්ට මුදල් නොගෙවා තිබුණු මාස පහත පරිදි විය.

| **දිස්ත්‍රික්කය** | **මුදල් නොගෙවූ මාස** |
|---|---|
| වවුනියාව | ජනවාරි - ජුනි, අගෝස්තු |
| මාතලේ | ජනවාරි - මාර්තු |
| කුරුණෑගල | ජනවාරි - මැයි දෙසැම්බර් |
| අම්පාර | ජනවාරි - අප්‍රේල් |
| මුලතිව්<br>පොළොන්නරුව | ජනවාරි - අප්‍රේල් |
| අනුරාධපුරය | ජනවාරි |

**3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පදවි ප්‍රාප්ති උත්සවයක් වෙනුවෙන් පළකරන ලද පුවත්පත් දැන්වීම් වෙනුවෙන් රු.508,533 ක් වැයකර තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 39 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 03 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 457 | 293 | 164 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 84 | 76 | 08 |
| (v) | වෙනත් | 04 | 03 | 01 |
| | **එකතුව** | **598** | **414** | **184** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 184 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. මෙම පුරප්පාඩුවලින් 126 ක් උපදේශන නිලධාරී තනතුරු වූ අතර, ඔවුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කිරීමට නොහැකිවූ නිසා අදාළ සැලැසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

(ii) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 09 ක් නොපුරවා දීර්ඝ කාලයක් පැවතීම ප්‍රධාන වශයෙන් වාර්තාවේ දක්වා ඇති පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම අනුව ප්‍රමාණවත් ලෙස කාර්යයන් ඉටුකිරීමට නොහැකි වීමට එයින් බලපෑමක් වී තිබුණි.

**(ආ) නිෂ්කාර්ය මානව සම්පත්**

2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් පසුව නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන අංශයේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් 78 ක් මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි. ඔවුන් වෙත 2015 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් විධිමත් ලෙස රාජකාරි පැවරීම් සිදුකර නොතිබුණි.